

# සංසාරාරණ්‍යයෙන් සමුගත් දැවැන්තයා

## සයිමන් නවගත්තේගම නම් වූ මහා පුරුෂයා සමග දස වසරක්



**ශ්‍රීනාත් මද්දුමගේ**

ගතවූ සතියේ එක් රැයක අවේලාවේ නාද වූ මගේ දුර කථනය ලංකාවෙන් රැගෙන ආවේ දුක්මුසු පුවතක්. දුරකථනයේ අනෙක් කෙළවරේ සිට ගලා ආවේ ශ්‍රීයන්ත මෙන්ඩිස් ගේ කටහඬ.

සයිමන් සර් නැතිවුණා....

ඒ ආරංචියත් සමග මගේ දෑසට කඳුලක් ඉනුවෙ නොදැනුවත්ව ම. ඒ දැවැන්තයාගේ සෙවණැල්ල සේ දශකයක පමණ කාලයක් ගත කළ ජීවිතය සිනමා සිත්තමක් සේ මගේ මතකයට නැඟෙයි.

මගේ නාට්‍ය ජීවිතයේ දෙවන ගුරුවරයා වූ නවගත්තේගම ශූරීන් ගේ ඇසුරට මා පත් වුයේ 1984 වසරේ දී. නවගත්තේගම සිය පන්ඩුකාභය නමැති නාට්‍යයට නළු නිළියන් තෝරා ගනිමින් සිටින බවට මගේ මිතුරෙකුගෙන් ලද ආරංචියකට අනුව මා ද ටවර් රඟහලට ගියේ ඊට සම්බන්ධ වීමේ බලාපොරොත්තුවෙන්. නළු නිළියන්ට උපදෙස් දෙමින් සිටි ඔහු දෙස ප්‍රේක්ෂකාගාරයේ සිට දැඩි අවධානයකින් බලා සිටි කොළු ගැටයා ඔහු දකින්න ඇති.

තමුසෙ මොකටද ආවෙ..? ඔහු මගෙන් කෙළින්ම ඇහුවා.
බයෙන් සැකෙන් වුණත් මම උත්තරයක් ගැට ගහගත්තා... "මං ආවෙ නාට්‍යයට සම්බන්ධ වෙන්න.. " කොළුගැටයා උත්තර දුන්න විදිහට නවගත්තේගමයන්ට හිතෙන්න ඇති ඔහුටත් අවස්ථාවක් දී බලන්න.

එහෙම නාට්‍ය වලට සම්බන්ධ වෙන්න බැහැ.. මේ ඉන්න හැමෝම ඉන්ටවිව් කරලා අරන් තියෙන්නෙ... ඔහු කිව්වා මං බලා හිටියා.

.. හොඳයි එහෙනම් වේදිකාවට ඇවිත් සින්දුවක් කියනවා .. ඔහු අණ කළා. කොළු ගැටයා කිසිම සබකෝලයක් නැතිව වේදිකාවට නැගලා හොඳ සද්දෙන් සින්දුවක් කිව්වා. ඒ වෙලාවේම නවගත්තේගමයන් තමාගේ නාට්‍යයේ චරිතයක් මේ කොළු ගැටයාට දුන්න එක එහුට වේදිකාවේ දිග ගමනක් යන්න ආශිර්වාදයක් වුණා. එදා ආරම්භ කළ ගමන නවගත්තේගම ශූරීන්ගේ සුභ සහ යස, සුදු සහ කළු, ලෝකෝත්තර, සුරලොව යට, 22 වත්ත සහ ගුවන් විදුලි නාට්‍යයක් වූ වානරයා දක්වා යන්නට මට අවස්ථාව ලැබුණා.

නවගත්තේගමයන් සමග ඉතා සමීපව ඇසුරු කිරීමට මට අවස්ථාව උදාවුණේ ඔහු යටතේ වසර 6 ක් පමණ කාලයක් සේවය කිරීමට ලැබීම හේතුවෙනි. ඔහු කලක් යුනිසෙෆ් ආයතනයට අනුබද්ධ ජන උදාව සන්නිවේදන ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ වරයා වශයෙන් සේවය කරන ලද අතර ඒ කාලයේදී ඔහුගේ යටතේ එම ව්‍යාපෘතියේ සේවය කිරීමට මටද අවස්ථාව උදාවුණා. නවගත්තේගමයන් ගේ සංකල්පනාවක් මත නිර්මාණය වූ එම ව්‍යාපෘතියේ අරමුණ වූයේ අඩු ආදායම් ලාභී පැල්පත් වාසී දරුවනට කලාව සහ සාහයය පිළිබඳව දැනුවත් කිරීම හා කලා මාධ්‍යය තුළින් ඔවුනට සෞඛ්‍ය පණිවුව රැගෙන යාමත් ය. නිහාල් ප්‍රනාන්දු, කිංස්ලි ලෝස්, රූපසිංහ කංකානම්ගේ, රෙජිනෝල්ඩ් ජයමාන්න හා රත්න ශ්‍රී නම්බුගේ යන ප්‍රවීණයන් ද විවිධ අංශ වලින් සම්බන්ධ කරගෙන වසර ගණනාවක් තිස්සේ කොළඹ අවට පැල්පත්වාසී ජනතාවට ඔහු ලබා දුන් සේවාව ප්‍රසංශනීයයි.

බොහෝ දෙනා නවගත්තේගමයන් හඳුනාගෙන ඇත්තේ සාහිත්‍ය ධරයකු හා නාට්‍ය වේදියෙකු ලෙස පමණයි. එහෙත් ඔහු නිහඬව අප රටේ පැල්පත් වාසී ජනයාට කරන ලද සේවය පිළබඳව සටහනක් තැබීම මා සතු යුතුකමක් ලෙස සිතමි

ඔහු ඇසුරෙහි මා ගත කළ කාලය තුළ මා ලැබූ දැණුම සහ අධ්‍යාපනයට වඩා මා හට පන්නරය ලබා දුන්නේ මේ අත්දැකීම් යයි මට සිතේ. ඔහුගෙන් ලද ප්‍රශංසා මෙන්ම බැනුම් ද අපමණ ය. රසවත් සිදුවීම් ද එමටය. එහෙත් ඒවා ලිවීමට මේ අවස්ථාව උචිත නොවේ යයි මට සිතේ.



මේ පුංචි මිනිසා තුළ දැවැත්යෙකු ජීවත් වුව ද ඔහු ඉතා සරළ දිවි පෙවෙතක් ගත කල අයෙක් විය. මොරටුවේ මගේ නිවසට ආසන්න මහල් නිවාසයක ජීවත් වූ ඔහුට තමනගේම කියා වහනයක් පවා නොතිබුණි. ව්‍යාපෘතියේ සේවය කාලයේ ලබා දී තිබූ රාජකාරි වාහනය හැරුණ විට ඔහු ගමන් බිමන් ගියේ බසයෙනි. හිස් වැසුම ඔහ්ගේ අනන්‍යතාවයේ ලක්ෂණයක් විය. එහෙත් මේ පුංචි සරළ මිනිසා ලාංකික සාහිත්‍ය හා නාට්‍ය ඉතිහාසයේ නොමැකෙන නමක් සනිටුහන් කිරීමට තරම් දැවැන්තයෙකු විය.

1974 මැයි 15 වන දා පළමුවරට ලුම්බිනියේ දී වේදිකා ගත වූ සුභ සහ යස නාට්‍යය දිවයිනේ ගමක් නියම් ගම් සිසාරා වේදිකා ගත වූ එකම නාට්‍යය බවට විවාදයක් නැත. ඔහු ලියූ ග්‍රන්ථ අතරින් සාහිත්‍ය සම්මාන හිමි වූ පොත් රැසකි. ඔහුගේ භාෂා විලාසය මෙන්ම බස හැසිරවීම තුළින් ඔහු මවන චිත්ත රූප පාඨකයා ඇද බැඳ තබා ගන්නට සමත් විය.

එමෙන්ම දේශපාලනය පිළිබඳ ඔහු තුළ තිබූ අවබෝධය සුභ සහ යස නාට්‍යයේ එන මේ දෙබස් ඛණ්ඩයෙන් මනාව පසක් වෙයි.

**සුභ** - මේක ඇත්තටම දඬුවමක් ද..? මේ ඔටුන්න දරාගෙන මම මොකක් කරන්නද? මම ආසා කරන ආඥාවක් පනවන්න මට සත් අවුරුද්දක් ගත වේවි.. මගේ ව්‍යායාමය නිෂ්ඵලයි.. මේ සිංහාසනයේ ඉඳගෙන මොන මගුලක් වත් කරන්න බැහැ..

සුභ සහ යස නාට්‍යය මුල් වරට ඉදිරිපත් කරන විට එහි සමරු කලාපයේ ඔහු තැබූ සටහන මෙසේ විය.

විප්ලවීය අවස්ථාවකින් තොරව විප්ලවයක් ඇති නොවන්නේ ය. සෑම විප්ලවීය අවස්ථාවකින් විප්ලවයකින් කෙළවර නොවන්නේ ය යන සිද්ධාන්තයේ නිරවද්‍යතාව කුමක් ද? ඓතිහාසික අවස්ථාවේ සීමාවන් හා පුද්ගල නිශ්‍රිත හේතු නිසා අසාර්ථක වූ විප්ලව ව්‍යාපාරයක් කලා නිර්මාණයකින් කෙසේ නිරූපනය කළ හැකි ද?

සුභ සහ යස නාට්‍යයේ නවගත්තේගමයනගේ අවසන් දෙබස මගේ සිහියට නැඟේ.

**රජ** - මගේ රට වැසියනි.. තොපගේ රජතුමාට පිස්සු.. තොපගේ රජතුමා තොපට සරදමක්.. මට වැටහෙන්නේ නෑ.. මගේ මරණය තොපට යහපතක්ම වේවා..

මෙම දෙබස සමඟ ඔහු වේදිකාව මත ඇද වැටේ. විදුලි ආලෝකය නිවී යයි. ප්‍රේක්ෂක ප්‍රතිචාර මැද ඔහු වේදිකාවට පැමිණ ඔවුනට ආචාර කරයි. එසේ ඔබත් මාත් ඉදිරියට නැවත පැමිණෙන්නට නවගත්තේගමයන් අද අප අතර නොමැත. එහෙත් ඔහු අපට දායාද කළ නිර්මාණ මෙන්ම ඔහුගේ නාමයත් සදා අමරණීය යි. සයිමන් සර්.. ඔබට නිවන් සුව.. ■

සයිමන් නවගත්තේගම ශූරීන්ගේ වානරයා ගුවන්විදුලි නාට්‍යය ඔහු පසුව පොතක් ලෙස මුද්‍රණය කළේ ය. එහි පෙර වදනේ ඔහු මෙසේ සඳහන් කරයි.

***"සිරස වානරයා ඉදිරිපත් කෙළේ ගුවන්විදුලි නාට්‍යයක විලාශයෙනි. බාලෙහි සිට මා හඳුනාගෙන සිටින ශ්‍රීනාත් මද්දුමගේ වානරයා චරිතය විශිෂ්ට රංගන දායකත්වයකින් ලේ මස් සහිත සංකීර්ණ පැවතුම් ඇති මහා පුරුෂයෙකු බවට පත් කෙළේ ය....."***

සිය ගුරුවරයෙකු වැනි වූ සයිමන් නවගත්තේගම ශූරීන් පිළිබඳ ශ්‍රීනාත්ගේ සටහනට මෙසේ ඉඩ සදමු.




